සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව හදාරන්නෙකුට වඩාත්ම වැදගත්වන දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

(1) දාඨාවංසය යි (2) බෝධිවංසය යි (3) මහාවංසය යි (4) දීපවංසය යි

(02) පැරණි ජනතාව විසින් නිර්මාණය කරන ලද හෝ පරිහරණය කරන ලද හෝ දැනට ඉතිරිව ඇතිදේ හඳුන්වන්නේ කුමන නමකින්ද?

(1) පුරා වස්තු (2) නටබුන්
(3) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය (4) සාහිත්‍ය මූලාශ්‍රය

(03) නාණක විද්‍යාව විෂයයෙන් හදාරනු ලබන්නේ මින් කුමක් පිළිබඳවද?

(1) පැරණි කාසි (2) වාස්තු විද්‍යාව
(3) යකඩ නිස්සාරණ තාක්ෂණය (4) මැණික් කර්මාන්තය

(04) උඩමළුල, අලුගල්ගේ, බුන්දල ප්‍රාග්ඓතිහාසික ස්ථාන අයත් වන්නේ මින් කුමන දේශගුණික කලාපයටද?

(1) පහතරට වියළි කලාපය (2) පහතරට අතරමැදි වියළි කලාපය
(3) තෙත් කලාපය (4) ශුෂ්ක කලාපය

(05) ඓතිහාසික යුගයේ මූලික ජනාවාස ගංගා නිම්න වලට පිටතින් පිහිටි ප්‍රදේශවල පැතිරී තිබීමට ප්‍රධාන හේතුව වූයේ,

(1) හේන් වගා කිරීමට වර්ෂා ජලය පමණක් ප්‍රයෝජනයට ගැනීමයි.
(2) ගංවතුර පාලනය කිරීමට සරිලන තාක්ෂණයක් නොදැන සිටීමයි.
(3) වෘත්තීන් පදනම් කරගෙන ගම් ව්‍යාප්ත වී තිබීමයි.
(4) ගංගා නිම්නයට පිටත ප්‍රදේශවල පස වගාවට සුදුසු වීමයි.

(06) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් ඉතා වැදගත් සිදුවීමක් වන්නේ,

(1) ක්ෂුද්‍ර ශිලා මෙවලම් භාවිතා කිරීමයි.
(2) යකඩ ලෝහය භාවිතා කිරීමයි.
(3) සංචාරක ජීවිතයක් ගත කරමින් ගල් ගුහාවල ජීවත් වීමයි.
(4) අලවර්ග හා සතුන් පුළුස්සා ආහාරයට ගැනීමයි.

(07) සෙල්ලිපිවල කසීකාරගාම නමින් හඳුන්වා ඇත්තේ,

(1) ගොවියන් විසූ ගම් ය. (2) වළං සාදන්නන් විසූ ගම් ය.
(3) ධීවරයින් විසූ ගම් ය. (4) වරාය ආශ්‍රිතව තිබූ ගම් ය.

(08) දඹුල්ලේ පිහිටි කළුදිය පොකුණ සෙල්ලිපියේ සඳහන් වන වැදගත් කාරණයක් වූයේ,

(1) පරුමකවරුන් සතු බලය පිළිබඳව යි.
(2) දසගම් ඇත්තන් පිළිබඳව යි.
(3) කැලෑවල ගස් කොළන් නොකැපිය යුතු බව යි.
(4) සත්ව ඝාතකයින්ට මරණ දඬුවම පැනවූ බව යි.

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 9 - 10 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම.
B - හේන් වගාව සඳහා අයකළ බදු අහෝසි කිරීම.
C - රජයේ බදු අය කිරීම වඩාත් ක්‍රමවත් කිරීම.
D - දිවයිනම එක් සේසත් කළ ප්‍රථම පාලකයා වීම.
E - ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්වට ගල්කණු සිටුවීම.

(09) නිශ්ශංකමල්ල රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A හා C (2) A හා B (3) B හා D (4) B හා E

(10) වසභ රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) B හා C (2) D හා E (3) A හා C (4) A හා B

(11) රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලය මින් කුමක්ද?

(1) බලය මධ්‍යගත වීමයි. (2) බලය විමධ්‍යගත වීමයි.
(3) ජාතික රාජ්‍ය බිහිවීමයි. (4) පරුමකවරුන්ගේ බලය වැඩිවීමයි.

(12) මීට වසර 2000 කට පමණ පෙර නීතිය පිළිබඳ හසල දැනුමක් ඇති වෘත්තිකයින් හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?

(1) ලපන (2) වෙජ (3) වොහාර (4) කබර

(13) අතීතයේදී කාම්බෝජවරු හා අයෝනියන්වරු බහුල වශයෙන් මෙරටට පැමිණ ඇත්තේ,

(1) ආගමික කටයුතු සඳහාය. (2) වෙළඳ කටයුතු සඳහාය.
(3) ආක්‍රමණ සඳහාය. (4) සංචාරක කටයුතු සඳහාය.

(14) - ශ්‍රී ලාංකික තානාපතිවරයෙකු රෝමයෙන් වීදුරු පබළු රැගෙන ඒම.
- ශ්‍රී ලංකාවෙන් චීනයට විසිවතාවක් රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යෙදීම.

ඉහත සිද්ධීන් හා සම්බන්ධ රජවරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පළමුවන විජයබාහු රජතුමා, පළමුවන ගජබාහු රජතුමා
(2) හතරවන කාශ්‍යප රජතුමා, වසභ රජතුමා
(3) භාතිකාභය රජතුමා, හයවන අග්ගබෝධි රජතුමා
(4) දුටුගැමුණු රජතුමා, දෙවන පරාක්‍රමබාහු රජතුමා

(15) මීට අවුරුදු තුන්දහස් දෙසිය පනහකට ඉහත කාලවකවානුවක මෙරට වැසියෝ දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව දැනසිටි බවට වැදගත්ම නිදසුන වන්නේ,

(1) උඩරංචාමඩම නිවාසයෙන් හමුවූ මැටි බඳුනක කොටස් ය.

(2) රංචාමඩම ප්‍රදේශයෙන් හමු වූ මැටි ඔරු සුසාන ය.

(3) දැදිගම කොට වෙහෙරෙන් හමු වූ ඇත් පහන ය.

(4) සමනළ වැව් ප්‍රදේශයෙන් හමු වූ යකඩ උණුකල උඳුන් ය.

(16) හෙළ වාස්තු විද්‍යා ගොඩනැගිලි නිර්මාණයේදී ඒවා පරිහරණය කරන්නන්ගේ ස්වස්ථතාව පිළිබඳ අවධානය යොමුකළ බවට තොරතුරු හමුවූයේ මින් කුමන ස්ථානයකින්ද?

(1) රුවන්වැලි සෑයේ අත්තිවාරම (2) සීගිරියේ ජල උද්‍යානය

(3) ජේතවනාරාම භූමිය (4) ආලාහන පිරිවෙන් සංකීර්ණය

(17) අතීතයේදී මාවත්වල දුර ප්‍රමාණය මැනීමට භාවිතා කළ මිණුම් ක්‍රමය වූයේ

(1) ආංගුලය (2) කරීසය (3) ගව්ව (4) වියත

(18) අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු බව ප්‍රකාශ කළ රජතුමා කවුරුන්ද?

(1) මහා පරාක්‍රමබාහු රජතුමා (2) මහසෙන් රජතුමා

(3) වසභ රජතුමා (4) දුටුගැමුණු රජතුමා

(19) අවකාශය මැනීමට අනුව වර්තමාන අක්කර දෙකකට සමාන භූමි ප්‍රදේශයක් අතීත මිණුම් අනුව ගණනය කළ විට

(1) අමුණකි. (2) කරීසයකි. (3) පැලකි. (4) කිරියකි.

(20) අනුරාධපුරය ආදී වියළි කලාපීය ප්‍රදේශවලින් හමුවූ ඌරාකැට ළිං තැනීමෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ වැදගත්ම කාර්යය වූයේ,

(1) ජලය වඩාත් සිසිල්ව තබා ගැනීමය. (2) ජලයේ කිවුල් බව නැති කර ගැනීමය.

(3) ජලය වාෂ්ප වීම වළක්වා ගැනීමය. (4) පෞද්ගලික ජල පරිහරණය සඳහාය.

(21) දේශීය චාරිත්‍ර අනුගමනය කරමින් වර්තමානයේදී ද කිරිමඩු ශාන්තිකර්මය පවත්වනු ලබන පළාත් දෙක තෝරන්න.

(1) උතුරුමැද පළාත, වයඹ පළාත (2) දකුණු පළාත, උතුරු මැද පළාත

(3) සබරගමු පළාත, වයඹ පළාත (4) සබරගමු පළාත, ඌව පළාත

(22) "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් සෙල්ලිපියක සඳහන් වීමෙන් අදහස් කර ඇත්තේ,

(1) සතුන් මරණ අයට මරණ දඬුවම ලබාදෙන බව ය.

(2) ජලාශවල ජීවත් වන පක්ෂීන් නොමැරිය යුතු බව ය.

(3) කැලෑවල ගස් කොළන් නොකැපිය යුතු බව ය.

(4) උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බව ය.

(23) පහත "අ" තීරුව සමඟ "ආ" තීරුව නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. ආරක්ෂක නිළධාරීන් | A - අන්වයාතදාස |
| 2. රාජකීය නිළධාරීන් | B - කුඩීන් |
| 3. සාමාන්‍ය ජනතාව | C - මේකාප්පර් |
| 4. පාරම්පරික දාසයන් | D - රද්කොල් සමදරු |

(1) DCBA (2) CDBA (3) CDAB (4) ADBC

(24) ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් සෙල්ලිපියක "අඩික" නමින් හඳුන්වා ඇති නිළධාරියා විසින් ඉටු කරනු ලැබූ කාර්යය මින් කුමක්ද?

(1) වැව් හා ඇළ මාර්ගවල ජල පරිභෝජනය සඳහා බදු එකතු කිරීම.

(2) ඇළ මාර්ගවලින් ජලය මුදා හැරීම පිළිබඳව කටයුතු කිරීම.

(3) වැව් පද්ධතිය නඩත්තු කිරීම

(4) ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධව කටයුතු කිරීම.

(25) දේශීය ආහාර පිළිබඳ සැලකිලිමත් වූ අපේ පැරණි ජනතාව ධාන්‍ය වර්ග බැද කුඩු කොට සාදා ගනු ලැබූ ආහාර වර්ගයක් හැඳින්වීමට භාවිතා කළ නම මින් කුමක්ද?

(1) තිල සංගුලිකා (2) අත්සුණු (3) තියඹලාව (4) යවාගු

(26) පැරණි කාලයේදී පවා රේගු බදු අයකර ගැනීම මෙරට සිදුවූ බවට තොරතුරු හෙළිවන පැරණි වරාය පිහිටි ස්ථානය වූයේ,

(1) මහාතිත්ථ ය. (2) ගෝකණ්ණ ය. (3) කල්‍යාණි ය. (4) ගොඩවාය ය.

(27) පහත සඳහන් වන රජවරු හා රැජිණියන් අතුරින් පොළොන්නරු රාජධානි සමයට අයත් වන්නන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - හතරවන පරාක්‍රමබාහු රජතුමා　B - තුන්වන විජයබාහු රජතුමා

C - ලීලාවතී රැජිණ　D - මහසෙන් රජතුමා

E - කල්‍යාණවතී රැජින　F - මහා පරාක්‍රමබාහු රජතුමා

(1) C,E,F (2) B,C,E (3) A,C,F (4) C,D,B

- පහත වගුවේ සඳහන් A සිට F දක්වා ඇති තොරතුරු ඇසුරින් 28, 29 හා 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ඓතිහාසික සිදුවීම |
|---|---|
| A - තුන්වන පරාක්‍රමබාහු | D - සිංහල සංගෙ නම් කැරැල්ල ඇතිවීම |
| B - හතරවන පරාක්‍රමබාහු | E - දළදාව දකුණු ඉන්දියාවට රැගෙන යාම |
| C - හයවන බුවනෙකබාහු | F - පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම |

(28) යාපහුව රාජධානි සමයේ සිදුවූ ඓතිහාසික සිදුවීම හා එයට සම්බන්ධ රජතුමා සඳහන් පිළිතුර කුමක්ද?

(1) A හා D (2) A හා E (3) B හා E (4) C හා F

(29) කුරුණෑගල රාජධානි සමයේ ඓතිහාසික සිදුවීම හා එයට සම්බන්ධ රජතුමා සඳහන් පිළිතුර කුමක්ද?

(1) B හා F (2) C හා E (3) A හා F (4) C හා D

(30) කෝට්ටේ රාජධානි සමයට අයත් ඓතිහාසික සිදුවීම හා එයට සම්බන්ධ රජතුමා සඳහන් පිළිතුර කුමක්ද?

(1) B හා F (2) C හා E (3) C හා D (4) A හා D

(31) කෝට්ටේ රාජධානි සමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ,

(1) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වීම.

(2) සංදේශ කාව්‍ය ලිවීම ආරම්භ වීම.

(3) පිළිම ගෙයට සම්බන්ධකොට දේවාල ඉදි කිරීම.

(4) මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුමවීමේ ක්‍රමයක් ආරම්භ වීම.

(32) පහත සඳහන් සිදුවීම් අතුරෙන් යාපන රාජ්‍යයට සම්බන්ධ නිවැරදි සිදුවීම තෝරන්න.

(1) කෝට්ටේ රාජධානිය බිඳ වැටීමෙන් පසුව යාපන රාජධානිය ආරම්භ වීම.

(2) පෘතුගීසීන් පැමිණෙන අවධියේ සංකිලි නම් රජු පාලකයා ලෙස කටයුතු කිරීම.

(3) යාපනයේ බහුතර ජනතාව පෘතුගීසීන්ට පක්ෂපාතී වීම.

(4) ආර්ය චක්‍රවර්තී රජ පරපුර විසින් පාලනය ගෙන යාම.

(33) පහත A,B,C,D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් කාලවකවානු අනුව නිවැරදිව පෙළ ගැස්වූ විට පිළිතුර කුමක්ද?

A- අලකේශ්වර පරපුර විසින් රයිගම වෙනම රාජධානියක් පිහිටුවීම.

B- දේවපතිරාජ ඇමතිවරයා ආර්ථික, ආගමික අධ්‍යාපන අංශ දියුණු කිරීම.

C- සේනාසම්මත වික්‍රමබාහු රජු උඩරට රාජධානිය ආරම්භ කිරීම.

D- කාලිංග මාඝ විසින් මෙරට ආක්‍රමණය කිරීම.

(1) A,B,C,D (2) B,D,A,C

(3) D,B,A,C (4) D,B,C,A

(34) බිසවගේ සහෝදරයාට රජකම උරුම වීමේ උඩරට සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වය හිමි වූ පිළිවෙළ දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) දෙවන රාජසිංහ රජු - ශ්‍රී විජයරාජසිංහ රජු

(2) රාජාධිරාජසිංහ රජු - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(3) දෙවන රාජසිංහ රජු - කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු - ශ්‍රී විජයරාජසිංහ රජු

(35) පහත දැක්වෙන තොරතුරු අතුරින් පළමුවන විමලධර්මසූරිය රජතුමාට පමණක් අදාළ වන පිළිතුර කුමක්ද?

A - දන්තුරේ සටනින් පෘතුගීසීහු අන්ත පරාජයට පත් වීම.

B - රන්දෙණිවල සටනට නායකත්වය දීම.

C - පෘතුගීසීහු මෙරටින් පළවා හැරීම.

D - දෝන කතිරිනා කුමරිය විවාහ කර ගැනීම.

(1) A හා B ය. (2) A හා D ය.

(3) B හා D ය. (4) A හා C ය.

(36) පුනරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කමක් සඳහන් පිළිතුර කුමක්ද?

(1) බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට ප්‍රචලිත වීම.

(2) යුරෝපීය ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලැබීම.

(3) ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම.

(4) රෝම ලන්දේසි නීතිය ලැබීම.

(37) පුනරුද සමයේ කලා ශිල්පවල සිදුවූ වෙනස්කම් සම්බන්ධ සාවද්‍ය පිළිතුර තෝරන්න.

(1) කලාකෘතිවලට පල්ලියේ අනුග්‍රහය ලැබීම.

(2) නිර්මාණ ශ්‍රේණි වශයෙන් ඉදිරිපත් වීම.

(3) ලෞකික රස වින්දනයට මුල්තැන දීම.

(4) ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ කිරීම.

(38) යුරෝපා ජාතීන්ට ප්‍රථමයෙන් ආසියාවට පැමිණීමට නව මුහුදු මාර්ගයක් සොයා ගැනීම පිළිබඳ ගෞරවය හිමි වන්නේ,

(1) ක්‍රිස්ටෝපර් කොළොම්බස්ට ය. (2) වස්කෝද ගාමාට ය.

(3) පර්ඩිනන්ඩ් මැගලන්ට ය. (4) බර්තෝලමියු ඩියස්ට ය.

(39) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධියේ කෝට්ටේ රාජධානියේ රජකම් කළ රජතුමා වූයේ

(1) පළමුවන විමලධර්මසූරිය රජතුමා ය. (2) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.

(3) රාජාධිරාජසිංහ රජතුමා ය. (4) අටවන වීර පරාක්‍රමබාහු රජතුමා ය.

(40) පෘතුගීසීන් උඩරට යටත් කර ගැනීම සඳහා කළ සටන්වලදී දියෝගු ද මෙලෝ කැස්ත්‍රෝ විසින් මෙහෙය වූයේ,

(1) මුල්ලේරියා සටන යි. (2) ගන්නෝරුව සටන යි.

(3) බලන සටන යි. (4) දන්තුරේ සටන යි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද, ලකුණු කර නම් කරන්න.

(i) පිදුරංගල, කොඩ්ඩියාර්, ගොඩවාය, බදුල්ල, මුලතිව්, පේදුරුතුඩුව, යාපහුව, කෝට්ටේ, ගන්නෝරුව, කැලණි ගඟ, හුරුළු වැව, මාතලේ අළුවිහාරය (ලකුණු 12)

(ii) කැලිකට්, මලක්කා සමුද්‍ර සන්ධිය, රතු මුහුද, ජාවා දූපත, ඉතාලිය, ජිනෝවා (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - සමන්තපාසාදිකාව ග්‍රන්ථය රචනා කළ කතුවරයා
B - මහාවංසයේ සඳහන් පරිදි මෙරට පාලනය කළ ප්‍රථම රජතුමා
C - මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීමේ පුරෝගාමියා
D - කිතබ්-අල්-මස්ලික්වාල්-මමාලික් ග්‍රන්ථයේ ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කර ඇති නම (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(ii) (1) A වලින් දැක්වෙන ශිලා ලිපිය හඳුන්වන නම කුමක්ද?
(2) මෙම ශිලා ලිපිය පිහිටුවා ඇති ඓතිහාසික නගරය නම් කරන්න.
(3) මෙය කරවන ලද රජතුමාගේ නම කුමක්ද?
(4) එම රජතුමා කුමන රාජවංශයට අයත් වේද?



A රූපය

(ලකුණු 04)

(iii) (1) B පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?
(2) මේවා තැනීමට භාවිතා කර ඇති ප්‍රධාන අමුද්‍රව්‍ය කුමක්ද?
(3) මේවා භාවිතා කර ඇත්තේ කවුරුන් විසින් ද?
(4) මේවා සොයා ගනු ලැබූ ඓතිහාසික ස්ථානය සඳහන් කරන්න.



B රූපය

(ලකුණු 04)

## II කොටස

(02) (i) මහාශිලා සුසාන හෙවත් ශිලා මංජුසා සොහොන් පිහිටි ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය සකස් වී තිබූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාව හා අභිචාර විධි පිළිබඳ උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) රජවරුන් පෙනී සිටි ස්වරූපය හා ඔවුන්ගේ ක්‍රියාකලාපය අනුව පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප වලට අදාල වන රජවරු A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A. දේවත්ව

B. පර්වතරාජ

C. නර ඉසෙර (ලකුණු 03)

(ii) වැව් පද්ධති සෑදීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පැරණි කාලයේදී ශ්‍රී ලාංකික සමාජය කාන්තාවට ගෞරවයෙන් හා උසස් අන්දමෙන් සැලකූ බව නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පළමුවන විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් පුරාවස්තු හමුවූ ස්ථාන A,B,C අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A. වර්ණාලේපිත උළු

B. මල් කැටයම් 21 ක් සහිත වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක්

C. ප්‍රභුවරුන් පළඳින ලද කාර්නේලියන් පබළු සහිත මාලයක් (ලකුණු 03)

(ii) ඇළහැර ඇළ මගින් ජලය සපයන වැව් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අපේ පැරැන්නන් සතුව පැවති යකඩ නිස්සාරණ තාක්ෂණය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වැවක ප්‍රධාන අංග තුනක් නම් කර, ඉන් එක් අංගයක කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති සමාජ සංවිධානයේ ස්වරූපය අනුව නිෂ්පාදනය භුක්ති විඳින කණ්ඩායමට අයත් වූ පිරිස් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් කාර්යයන් සඳහා අය කළ බදු වර්ග හැඳින්වූ නම් A,B,C,D අනුපිළිවෙළින් ලියන්න.

A - හේන් වගාව උදෙසා

B - රජුට අයත් ඉඩම් වල වගා කිරීම උදෙසා

C - ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම උදෙසා

D - වැව්වල ජලය භාවිතා කිරීම උදෙසා

(ලකුණු 04)

(iii) පැරණි සමාජයේ කර්මාන්ත හා වෙළෙඳාම සංවිධානාත්මකව පැවති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ සැලකිය යුතු වටිනා දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුව පැවති බව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පහත සඳහන් සාහිත්‍ය කෘති අයත් වන යුගය A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A. ගුත්තිල කාව්‍ය

B. දළඳා සිරිත

C. මයුර සංදේශය (ලකුණු 03)

(ii) කෝට්ටේ රාජධානි සමයේ හයවන පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ සේවයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දෙවන නාගරීකරණ සමයේ ආගම හා ගෘහ නිර්මාණවල දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දඹදෙණි රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨ කාර්යභාරය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) මහනුවර රාජධානියේ ඉඩම් බුක්තිය පදනම් කරගෙන ප්‍රදානය කරන ලද ඉඩම් හැඳින්වූ නම් A,B,C අනුපිළිවෙළින් ලියන්න.

A - ගම් වැසියන් පරම්පරාගතව බුක්ති විඳි ඉඩම්

B - රදළ ප්‍රදානීන් සඳහා ප්‍රදානය කළ ඉඩම්

C - රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් (ලකුණු 03)

(ii) මහනුවර රාජධානියේ ආර්ථික දියුණුව උදෙසා පළමුවන විමලධර්මසූරිය රජතුමා අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහනුවර රාජධානි සමයේ කෘෂිකාර්මික ආර්ථික ක්‍රමය සකස් වී පැවති ආකාරය උදාහරණ දෙකක් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන රාජසිංහ රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ නැගී ආ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වෛද්‍ය විද්‍යාවේ දියුණුව උදෙසා පහත සඳහන් විද්‍යාඥයින් දෙදෙනා සොයාගත් වැදගත් දේවල් A,B අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A -මයිකල් සර්වෙස්

B - විලියම් හාවේ (ලකුණු 04)

(iii) පුනරුදයට බලපෑ හේතු දෙකක් නම් කර, ඉන් එක් හේතුවක් පැහැදිලි කරන්න.(ලකුණු 05)

(iv) පුනරුද සමයේ භාෂාව හා සාහිත්‍යයේ දියුණුව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ සිටි අග්‍ර ගණ්‍ය ප්‍රතිමා ශිල්පියෙක් වූ මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කළ ලෝක ප්‍රසිද්ධ ප්‍රතිමා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වූ සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පුනරුද සමයේ යුරෝපයේ ආර්ථික කටයුතු වල ඇති වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුනරුදය ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතිය වෙනස්වීම කෙරෙහි බලපෑ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. ....................



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10
විෂයය / பாடம் / Subject: ඉතිහාසය
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## ඉතිහාසය I

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 1 | (21) 4 | (31) 1 |
| (2) 1 | (12) 3 | (22) 3 | (32) 4 |
| (3) 1 | (13) 2 | (23) 2 | (33) 3 |
| (4) 4 | (14) 3 | (24) 4 | (34) 4 |
| (5) 2 | (15) 2 | (25) 2 | (35) 2 |
| (6) 2 | (16) 4 | (26) 4 | (36) 4 |
| (7) 1 | (17) 3 | (27) 1 | (37) 1 |
| (8) 2 | (18) 1 | (28) 2 | (38) 2 |
| (9) 4 | (19) 1 | (29) 1 | (39) 4 |
| (10) 3 | (20) 2 | (30) 3 | (40) 2 |

(ලකුණු 2×40 = ලකුණු 40)

## ඉතිහාසය II

(01) (අ) (i), (ii) සිතියමෙහි දක්වා ඇත. (ලකුණු 18)

(ආ) (i) A. බුද්ධඝෝෂ හිමි C. වසභ රජු
B. පණ්ඩුකාභය රජු D. සරන්ඩිබ් (ලකුණු 04)

(ii) 1. ගල්පොත ශිලා ලේඛනය 2. පොළොන්නරුව
3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු 4. කාලිංග වංශයට (ලකුණු 04)

(iii) 1. මැටි මුද්‍රා 2. මැටි
3. රජයේ නිලධාරීන් 4. තිස්සමහාරාමයේ පැරණි ගොඩනැගිල්ලකින්
(ලකුණු 04)

(02) (i) ඉබ්බන්කටුව, ගල් සොහොන් කනත්ත, යටිගල්පොත්ත (ලකුණු 03)

(ii) වාර්ෂික වර්ෂාපතන අගය
පසේ ස්වභාවය
භූ විෂමතාව
ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය
ජලවහනය (ලකුණු 04)

(iii) ◆ වැව් කේන්ද්‍ර කොටගත් ජනාවාස වර්ධනය වීම.
උදා:- සුමනවාපීගාම, විහාරවාපීගාම

◆ වෘත්තිකයින් විසූ ගම් බිහිවීම
උදා :- කසීකාරගාම, මණිකාරගාම, ගෝපාලගාම

◆ කාර්යය පදනම් කරගත් ගම් බිහිවීම.
උදා :- පට්ටනගාම, නියම්ගම්, ඔළගම් (ලකුණු 05)

(iv) ◆ තැනින් තැන ඇවිදිමින්, දඩයම් කරමින් ජීවත් වීම

◆ වර්ෂාධික කාලවල ගල්ගුහාවල ජීවත් වීම.

◆ කණ්ඩායම් වශයෙන් ජීවත් වීම.

◆ මිනිස් ඇටසැකිලි වල රතු ගුරුගල් ආලේප කිරීම.
උදා:- පාහියන්ගල

◆ නමා වකුටු කර මිනී වැළලීම
උදා :- කුරුවිට බටදොඹලෙන

◆ හිස් කබල්වල දෙකට බෙදෙන ලෙස සිදුරු විදීම.
උදා :- රාවණා ඇල්ල ලෙන (ලකුණු 06)

(03) (i) A - මහසෙන්
B - I කාශ්‍යප
C - කුටකණ්ණ අභය (ලකුණු 03)

(ii) ◆ ජලය සංරක්ෂණය කර ගැනීම
◆ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම (ලකුණු 04)

(iii) ◆ රාජ්‍ය පාලනය සඳහා කාන්තාවන්ට අවස්ථාව දීම. උදා :- චූල සීවලී බිසව
ලීලාවතී රැජිණ

◆ මව්වරුන් ලෙස ඉසිලූ වගකීම.

◆ කාන්තාවන් ප්‍රාදේශීය පාලනයේ පවා යෙදීම. උදා :- පරුමකලු
නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කිරීම. (ලකුණු 05)

(iv) චෝළයින් පරාජයට පත් කිරීම.
වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගැනීම.
වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම ආදී කරුණු දෙකක් පැහැදිලි කිරීම. (ලකුණු 06)

(04) (i) A. අභයගිරිය
B. ජේතවනය
C. ඉබ්බන්කටුව (ලකුණු 03)

(ii) මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ (ලකුණු 04)

(iii) ◆ බෙරගල සොහොන් ගැබකින් යබොර කැබලි හමුවීම.

◆ ස්වාභාවික සුළං බලය යොදාගෙන යකඩ නිස්සාරණය
උදා :- සමනල වැව

◆ මයිනහමක ආධාරයෙන් යකඩ නිස්සාරණය
උදා :- අලකොල වැව මෙහි තාක්ෂණය පිළිබඳව විස්තර කිරීම. (ලකුණු 05)

(iv) වැව් බැම්ම - විශාල ජලධාරිතාවයක් රඳවා ගැනීම.
රළපනාව - වැව් බැම්ම ඛාදනය වැළැක්වීම.
සොරොව්ව - වැව් වලින් ක්‍රමානුකූලව ජලය පිටතට ගැනීම.
බිසෝකොටුව - අවම පීඩන තත්වයක් යටතේ ජලය පිටතට ගැනීම.

(ප්‍රධාන අංග තුනක් නම් කිරීමට ලකුණු 3යි.
ඉන් එක් අංගයක කාර්ය භාරය පැහැදිලි කිරීමට ලකුණු 3 යි.) (ලකුණු 06)

(05) (i) රජු, ප්‍රභූන්, රජයේ නිලධාරීන්, බෞද්ධ සංඝරත්නය

ii. A කැති අඩ/ කෙටුකනබ B බොජකපති
C මතරමජිබක D දකපති (ලකුණු 04)

iii. ◆ යකඩ කර්මාන්තය, තඹ කර්මාන්තය, මැණික් කර්මාන්තය, ඇත්දත් කර්මාන්තය වැනි විවිධ කර්මාන්ත තිබූ බවට සාක්ෂි හමුවීම.
උදා :- කම්මල්කරුවන් කබර ලෙස සෙල්ලිපිවල හමුවීම.
මහනුවර වේගිරිය දේවාලය අසල පිහිටි සෙල්ලිපියක දටික සුමන නම් ඇත්දත් ශිල්පියෙකු පිළිබඳ තොරතුරු හමුවීම.

◆ පැරණි වෙළඳපොළ පිළිබඳ සාක්ෂි හමුවීම.
උදා :- අනුරාධපුර නගරයේ දකුණු දොරටුව අසල පිහිටි කාළ සුමන නම් වෙළඳ පොළ

◆ විදේශ වෙළඳ සංවිධාන ස්ථාපිත වී තිබීම.
උදා :- නානා දේසී, වලිඤ්ජියාර් ආදී කරුණු උදාහරණ සහිතව විස්තර කිරීම. (ලකුණු 05)

(iv) ◆ පැරණි රෝහල් පැවතීම. උදා :- ආලාහන පිරිවෙනෙන් හමුවන සාක්ෂි

◆ දියුණු ශල්‍ය වෛද්‍ය උපකරණ භාවිතය

◆ වෙද පොත්, බෙහෙත් ඔරු, වෛද්‍යවරු සඳහා ගම්බිම් වෙන් කිරීම, පිළිබඳ තොරතුරු හමුවීම.

◆ පණ්ඩුකාභය රජුගේ කාලයේ පැවති මාතෘ නිවාස පිළිබඳ මහාවංශයේ තොරතුරු. දුටුගැමුණු රජු රෝහල් 18 ක් ඉදි කිරීම පිළිබඳ තොරතුරු (ලකුණු 06)

(06) (i) A කෝට්ටේ
B කුරුණෑගල
C. ගම්පොළ (ලකුණු 03)

(ii) ◆ වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කිරීම.

◆ සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.

◆ උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම.

◆ කෝට්ටේ රාජධානිය යටතේ රට එක්සත් කොට ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම. මෙවැනි ලක්ෂණ දෙකක් සඳහා (ලකුණු 2×2= 4)

(iii) ◆ දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පීය ආභාසය ලැබීම.

◆ පිළිම ගෙයට සම්බන්ධ කර දේවාල ඉදි කරීම.

◆ ලී කැටයම් සහිත ගොඩනැගිලි ඉදි කිරීම.

◆ ප්‍රධාන ආගම බුදු දහම විය.

◆ දේවාල ඉදිවීම මෙවැනි ලක්ෂණ දෙකක් විස්තර කිරීම. (ලකුණු 05)

(iv) ◆ කාලිංග මාඝ පරාජයට පත් කිරීම.

◆ චන්ද්‍රභානු නම් ජාවක රජු පරාජයට පත් කිරීම.

◆ විශිෂ්ට ග්‍රන්ථ සම්පාදනය නිසාවෙන් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම.
උදා :- කව්සිළුමිණ

◆ දේව පතිරාජ ඇමතිවරයා ලවා ආර්ථිකය සංවර්ධනය කිරීම. ආදී කරුණු 3ක් විස්තර කිරීම
(ලකුණු 06)

(07) (i) A - පරවේණි ගම්

B - නින්දගම්

C - ගබඩාගම් (ලකුණු 03)

(ii) ◆ ගොවිතැන දියුණු කිරීම.

◆ කපු වගාව දියුණු කිරීම.

◆ කොත්මලේ හා වලපනේ ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම.

◆ උඩරට රාජ්‍යය ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම. (ලකුණු 2×2 = 04)

(iii) ◆ ආර්ථික රටාව ස්වයංපෝෂිත එකක් වීම

◆ හෙල්මළු බැවුම්වල වී වගා කිරීම.

◆ හේන් ගොවිතැන

◆ ගෙවතුවල වගාව

◆ සත්ව පාලනය

◆ ලෝහ, ලාක්ෂා වැනි කර්මාන්ත උදාහරණ දෙකක් සහිතව විස්තර කිරීම. (ලකුණු 05)

(iv) ◆ පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම (රන්දෙනිවල සටන, ගන්නෝරුව සටන)

◆ පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම.

◆ උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම.

◆ ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම ආදී අභියෝග දෙකක් විස්තර කිරීම.
(ලකුණු 06)

## III කොටස

(08) (i) ජෝන් වයික්ලිෆ්
ජෝන් හස්
ඉරාස්මස්
මාටින්ලූතර් (ලකුණු 03)

(ii) A - රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී ගොස් පෙණහැලි මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ ශරීරය පුරාම විසිරී යෑම පිළිබඳ තොරතුරු අනාවරණය

B - මිනිස් රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු (ලකුණු 04)

(iii) ◆ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන්ට යටත්වීම.

◆ වෙළඳාමේ දියුණුව හා නව ධනවතුන් බිහිවීම

◆ බුද්ධි ප්‍රබෝධය

◆ පල්ලියේ ආධිපත්‍යය විවේචනය වීම.

හේතු දෙකක් නම් කර ඉන් එක් හේතුවක් පැහැදිලි කිරීම (ලකුණු 2+3=05)

(iv) ◆ ග්‍රීක හා ලතින් භාෂාවල නවෝදයක් ඇතිවීම.

◆ ග්‍රීක හා ලතින් භාෂා වලින් පොත්පත් ලියවීම.

◆ ගත් කතුවරු බිහිවීම. උදා :- ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ

කරුණු දෙකක් සහිත විස්තරයක් සඳහා (ලකුණු 05)

(09) (i) ලෝරෙන්සෝ මෙඩිසි නිරූපණය කරන ප්‍රතිමාව

පියෙටා ප්‍රතිමාව

මෝසෙස්ගේ ප්‍රතිමාව

දාවිත්ගේ ප්‍රතිමාව (ලකුණු 03)

(ii) ◆ නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට හැකි මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම.

◆ පුනරුදයේ දී ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.

◆ ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම.

◆ ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම. (ලකුණු $2 \times 2 = 04$)

(iii) ◆ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටී වෙළඳාම දියුණු වීම. (ජාතික වෙළඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති)

◆ මුදල් භාවිතය වැඩි වීම.

◆ චෙක්පත් හා බැංකු අණකර ක්‍රමය ආරම්භ වීම.

ආදී වෙනස්කම් දෙකක් විස්තර කිරීම. (ලකුණු 05)

(iv) ◆ මුද්‍රණ කර්මාන්තය දියුණු වීම සමඟ සමාජයේ දැනුවත්භාවය ඉහළ යාම.

◆ බටහිර චින්තනය මෙරටට ලැබීම.

◆ රෝමානු කතෝලික හා රෙපරමාදු ක්‍රිස්තියානි ආගම් මෙරට ව්‍යාප්ත වීම.

◆ බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරටට ලැබීම.

◆ යුරෝපයේ පැවති වාස්තු විද්‍යාත්මක ශෛලීන් මෙරටට ලැබීම ආදී කරුණු දෙකක් විස්තර කිරීම.

(ලකුණු 06)


පේදුරු තුඩුව
N
මුලතිව්
කොඩ්ඩියාර්
හුරුළු වැව
පිදුරංගල
යාපහුව
මාතලේ අළුවිහාරය
ගන්නෝරුව
කැළණි ගඟ
කෝට්ටේ
බදුල්ල
ගොඩවාය

1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)

